11/07/2010 - රාවය

**නෝනලාගේ පහනෙන් කසිප්පු කාරයින් එළිය බැලීම**

මේ රටේ කසිප්පු කාරයින් අද එළිය බලන්නේ නෝනලාගේ පහනෙනි. මෙය කෙනෙකුට ප්‍රහේළිකාවක් විය හැකිය. නොඑසේනම් තේරවිල්ලක් විය හැකිය. එහෙත් මේ ප්‍රහේළිකාව නොඑසේනම් තේරවිල්ල තේරුම් ගත් විට මැවෙන්නේ ලස්සන නොඑසේනම් විසිතුරු චිත්‍රයක් නොවේ.

මේ රටට 2005 වසරේ යීස්ට් ටොන් 1000ක් ආනයනය කර තිබේ. 2006 වසරේ යීස්ට් ටොන් 1500 ක් ආනයනය කර තිබේ. ඉතිං කොච්චර යීස්ට් ගෙන්නුවත් මොකද වෙන්නේ ? කේක් හදන්න යීස්ට් ඕනැනෙ, යීස්ට් නැතිව කොහොමද නෝනලා කේක් හදන්නෙ? බොහෝ අයට සිතෙන්නේ එසේය. ඒ මතුපිටින් පෙනෙන හැටිය. එහෙත් ඇත්ත එය නොවේ.



ලංකාවේ කේක් හදන්නට මෙච්චර යීස්ට් වුවමනා නැත. කොළඹ හතේ නෝනලා පමණක් නොව මොනරාගල අම්මලා උදේට කුරහන් පිට්ටු වෙනුවට ද, මාතර අම්මලා උදේ රතු හාල් බත් වෙනුවට කේක් හදන්නට පටන් ගත්තත් මෙතරම් යීස්ට් රටට ඕනෑ වෙන්නේ නැත. එසේනම් මෙතරම් යීස්ට් රටට ගෙන්වන්නේ ඇයි? මෙය ප්‍රහේළිකාවක් යැයි මුලින් ද කීවේ ඒ නිසාය.

යීස්ට් ආනයනයට කිසිදු සීමාවක් නැත. එහෙත් යීස්ට් මේ රටේ වැඩි වශයෙන් යෙදවෙන්නේ එක්තරා නීතිවිරෝධි කර්මාන්තයක් වෙනුවෙනි. ඒ නීතිවිරෝධි කර්මාන්තය වෙනුවෙන් යීස්ට් ඕනෑතරම් නිදහසේ ලබාගැනීමට හැකිව තිබේ. සැබවින්ම මේ කර්මාන්තය මුළුමනින්ම වාගේ රඳා පවතින්නේ මේ කිසිදු තහනමකින් තොරව යීස්ට් ආනයනයට හා බෙදාහැරීමට ඉඩකඩ පැවතීම නිසාය. එහෙත් යීස්ට් ආනයනය තහනම් කරවා කොහොමද? යීස්ට් වනාහි අහිංසක සියුමැලි නෝනලා කේක් හැදීමට ගන්නා අහිංසක අමුද්‍රව්‍යකි, ඉතින් යීස්ට් නැතුව කොහොමද නෝනලා කේක් හදන්නේ? එහෙත් ඇත්ත එය නොවේ. මේ විශාල වශයෙන් තහනමකින්, පාලනයකින් තොරව ආනයනය කරනු ලබන යිස්ට් ප්‍රධාන වශයෙන් යොදාගනු ලබන්නේ කසිප්පු නිෂ්පාදනය සඳහාය. නෝනලා නොඑසේනම් කේක්

හදන නෝනලා නිසා කසිප්පු ජාවාරම්කරුවන්ට කසිප්පු නිෂ්පාදනය සඳහා ඇති පදම් යීස්ට් කිසිදු බාධාවකින් තොරව ලබාගැනීමට හැකිව තිබේ. ස්වකීය කර්මාන්තය මහා පරිමාණයෙන් කරගෙන යාමට අවස්ථාව ලැබී තිබේ. අප කේක් හදන නෝනලාගේ පහනෙන් මේ රටේ කසිප්පු එළිය බලන බව කීවේ ඒ නිසාය.

කෙසේ වුවත් මේ තත්ත්වය තවත් දුරදිග යාමට ඉඩදිය යුතු නැත. නෝනලාගේ අහිංසක විනෝදාංශයකට මුවාවී මේ රටේ නීතිවිරෝධි, සමාජවිරෝධි කර්මාන්තයකට නිදහසේ තමන්ගේ කටයුතු කරගෙන යන්නට ඉඩ දිය යුතු නොවේ.

පැහැදිලිම කරුණ කේක් හදන්නට මේ රටට මෙතරම් යීස්ට් ප්‍රමාණයක් වසරකට අනවශ්‍ය බවය. එය දැනගැනීම සඳහා කේක් විශේෂඥයෙකුම වීම අවශ්‍ය නොවේ. සාමාන්‍යයෙන් රාත්තලක කේක් ගෙඩියකට අවශ්‍ය වන්නේ යීස්ට් ග්‍රෑම් 5ක් වැනි සුළු ප්‍රමාණයකි. වසරකට මේ රටට ආනයනය කරන යීස්ට් ප්‍රමාණය ටොන් 1000කි. ඒ අනුව මේ යීස්ට්වලින් කේක් හදනවා නම් වසරකට ටොන් ලක්ෂයක් පමන හැදිය යුතුය. එපමණ කේක් කන්නට නම් මේ රටේ ජනතාව තුන් වේලටම බත් නොව කේක් කනවා විය යුතුය. තුන්වේලටම කේක් කන නෝනලා හා ලොකු බබාලා සිදාදියේ කන්තෝරුවල ඉන්නා බව ඇත්තකි. එහෙත් රටේ බහුතර ජනතාව එසේ නොවෙති. ඒ අනුව කේක් හදන්නේ නැතිනම් මේ යීස්ට්වලට සිදුවන දෙය සොයාගැනීමට රහස් පරීක්ෂකයින් අවශ්‍ය නොවේ.

ඒ නිසා සිදුවන දෙය ඉතා පැහැදිලිය. යීස්ට්වලින් හොඳට පැසවෙන්නේ කටුස්සෝය. යූරියා පොහොරය. ගැරඬිය. කටුස්සෝ යොදා හෝ අඩු මිලට මත්පැනක් ලබාදෙනවා නම් යහපතක් නොවේ දැයි කෙනෙක් තර්ක කරන්නට ද පුළුවන. ඔවුන්ගෙන් අපට අසන්නට ඇත්තේ අඩු මිලට ලබාදෙනවා නම් වහ ද යහපත් ද යන්නයි. අඩු මිලට මත්පැනක් නොව ජනතාව ඉක්මනින් මරණය කරා ගෙන යන හළාහල විසක් වන කසිප්පු ලබාදීම වහාම නැවැත්විය යුතුය. ඒ සඳහා තුන්සිය හැටපස් දවසේම දිවා රෑ නොබලා පොලිසිවලට කානුපල්ලේ, කටුපඳුරු අස්සේ සැඟවී සිටිමින් හා කටුපඳුරු උඩින්, කටුකම්බි වැටවල් උඩින් පනිමින් කසිප්පු කාරයින් පස්සේ පැන්නීම අනවශ්‍යය. ඒ සඳහා සුළු ලෙහෙසි ප්‍රතිකර්මයක් ඇත. ඒ මේ සීමාවකින් තොරව යීස්ට් ආනයනයට වැට බැඳීමයි. විධිමත් ක්‍රමයක් යටතේ අවශ්‍ය අයට පමණක් නීත්‍යානුකූල කර්මාන්ත සඳහා පමණක් යීස්ට් ලබාදීමයි. කේක් බඩගිනි නෝනලා කුසගින්නේ තැබිය යුතු නැත. ඒ සඳහා ක්‍රමයක් සැකසිය හැකිය. කෙසේ වුවත් නෝනලාගේ පහනෙන් කසිප්පු කාරයින්ට එළිය බලන්නට ඉඩ දිය යුතු නැත. එසේ වුවහොත් මේ රට ලෙඩ කරන, ජනතාවට වින කරන කසිප්පු ජාවාරම කවදාවත් නැවැත්විය නොහැක. බලධාරීන් වගක්වයුත්තන් මේ සඳහා කඩිනම් පියවරක් ගන්නා තුරු අපි උනන්දුවෙන් බලා සිටිමු.

අපට අසන්නට ඇත්තේ මෙච්චර යීස්ට් ගෙන්නන්නේ කේක් කන්නද කියා නොවේ. මෙච්චර යීස්ට් ගෙන්නන්නේ රට නැති කරන්නට ද කියාය. රට නැති කරන නොඑසේනම් ජනතාව ලෙඩ කරන කසිප්පු නිපදවීමට උපකාර වීමට ද කියාය.



**මිලින්ද මොරගොඩ ජනබලවතනය**
161, කිඹිරිගස්යාය පාර, කොළඹ 5.
වෙබ් අඩවිය: www.milinda.org
විද්‍යුත් තැපෑල: email@milinda.org